**ජාතික ශිල්ප සභාව - 2024**

**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ශිල්ප සභාවේ ("සභාව") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය ප්‍රකාරව ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවත් රු.296,596 ක වියදමක් ආදායමට හිලව් කර තිබීමෙන් ආදායම් හා වියදම් අඩුවෙන් දක්වා තිබුණි. | ආදායමට වියදම හිලව් කර නොමැති අතර ගිණුම් වල අතිරික්තය හෝ ඌණතාවය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ලැබීම් ලෙස ගිණුම්ගත කර ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව ආදායම් හා වියදම් හිලව් නොකල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 53 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සඳහා සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | 2025 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කිරීමේදී සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය වාර්තාවල සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කල යුතුය. |
| (ඇ) | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු රු.1,306,074 ක් වූ සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 99 ඡේදය ප්‍රකාරව වියදම් ලෙස ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌණතාවය හා ජංගම වගකීම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතිය ප්‍රකාරව වසරේ වියදම් නිශ්චිතව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 123 ඡේදය ප්‍රකාරව කාලපරිච්ඡේදයක් සඳහා වූ සියළුම ආදායම් හා වියදම් එම වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට ඇතුළත් කළ යුතු වුවත් ඒ | 2025 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කිරීමේ දී සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතිය ප්‍රකාරව කාලපරිච්ඡේදයේ වියදම් හා ආදායම් එම වර්ෂයේ හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුව කටයුතු නොකර ඉකුත් වර්ෂයට අදාල රු.6,005,713 ක් වූ වියදම් හා රු.2,049,541 ක් වූ ආදායම්වල ශුද්ධ අගය වූ රු.3,956,172 ක් පූර්ව වර්ෂ ගැලපීම් ලෙස සමුච්චිත ලාභයට ගලපා තිබුණි. මෙසේ පූර්ව කාලපරිච්ඡේද වැරදි නිවැරදි කිරීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 47 ඡේදය ප්‍රකාර වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කළ යුතු වුවත් සභාව විසින් ඉකුත් කාලපරිච්ඡේදයට අයත් එකතුව රු.8,055,254 ක් වූ වැරදි 114 ක් ඇතුළත් කර සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කර නොතිබුණි. | | ඉකුත් වර්ෂ වල වැරදි නිවැරදි කිරිමේ දී සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කල යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 14 හි 34 ඡේදය ප්‍රකාරව ප්‍රධාන කළමණාකරන පාර්ශව වෙත ගෙවන ලද පාරිශ්‍රමික හා අනෙකුත් ගෙවීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු වුවත් සභාවේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ එම තොරතුරු හෝ සම්බන්ධිත පාර්ශව සමඟ ගණුදෙනු සිදු නොවුනු බවට මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | 2025 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේ දී හෙලිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිති ප්‍රකාරව සම්බන්ධිත පාර්ශව ගණුදෙනු හෙලිදරව් කල යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හි 76 ඡේදය ප්‍රකාරව රු.61,414,668 ක් වූ පාරිතෝෂික වෙන්කිරීම්වලට අදාළ පශ්චාත් සේවා ප්‍රතිලාභ බැඳියාව සහ සම්බන්ධ ප්‍රවර්ථන සේවා පිරිවැයේ වර්තමාන අගය ගිණුම්වල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | අධ්‍යයනය කර ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතිය ප්‍රකාරව පශ්චාත් සේවා ප්‍රතිලාභ බැඳියාව සහ සම්බන්ධ ප්‍රවර්ථන සේවා පිරිවැයේ වර්තමාන අගය ගිණුම්ගත කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.9,409,554 ක් හා සමුච්චිත ක්ෂය රු.3,841,145 ක් වූ ගෘහ භාණ්ඩ හා සවිකිරීම් අභ්‍යන්තර කමිටුවකින් තක්සේරුකර රු.5,560,500 කට | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිමේදී නිවැරදි කරනු ලැබේ. | වත්කම් නැවත අගය කිරීමේ දී පිරිවැය හා සමුච්චිත ක්ෂය අගය ගිණුම්වලින් ඉවත්කර නිවැරදිව |

| | | | |
|---|---|---|---|
| | ගිණුම්ගතකර තිබූ අතර, එහිදී පිරිවැය හා සමුච්චිත ක්ෂය ගිණුම්වලින් ඉවත්කර නොතිබීම හේතුවෙන් වත්කම්වල ශුද්ධ අගය රු.5,568,409 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ගොඩනැගිලි ධාරණ අගය රු.95,784,755 ක් වුවද උපලේඛණය අනුව ධාරණ අගය රු.63,200,283 ක් වූයෙන් ගොඩනැගිලි ශේෂ අතර රු.32,584,472 ක වෙනසක් පැවතුණි. සභාවේ ක්ෂය ප්‍රතිපත්තිය සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීම වුවද ඊට පටහැනිව උක්ත උපලේඛනගත ධාරණ අගයට ගොඩනැගිලි ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ගොඩනැගිලි ක්ෂය වියදම රු.2,858,014 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා ගොඩනැගිලි ශුද්ධ අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන අනුව හා උපලේඛණ අතර පවතින ශේෂයන් අතර වෙනස හදුනා ගැනීමට නොහැකි අතර ගොඩනැගිලි වටිනාකම් තක්සේරු කර මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු අතර, ගිණුම්ගත කළ අගය හා උප ලේඛනගත අගය සමාන විය යුතුය. ගිණුම් ප්‍රතිපත්තියට අනුකූලව ක්ෂය ගිණුම්ගත කල යුතුය. |
| (ඇ) | ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කළ යුතු අඟුල්මඩුව ලාක්ෂා පුහුණු මධ්‍යස්ථානයේ වැසිකිලි පද්ධතිය ඉදිකිරීම හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කින්නියා හස්ත කර්මාන්ත පුහුණු මධ්‍යස්ථානයේ වහලය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා දරන ලද රු.1,146,862 ක වියදම, සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම වටිනාකමෙන් ගොඩනැගිලි ගිණුම අඩුවෙන් හා වර්ෂයේ ඌනතාවය වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රාග්ධනිත කළ යුතු අගයන් නිවැරදිව හඳුනාගෙන වත්කම් ලෙස ගිණුම්ගත කල යුතුය. |
| (ඈ) | ජාතික ශිල්ප සභාවට අයත් පුහුණු මධ්‍යස්ථානවල පවත්වා ගෙන යනු ලබන ඉතිරි කිරීමේ බැංකු ගිණුම් 68 ක එකතු ශේෂය වූ රු.6,207,423 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී නිවැරදි කරනු ලැබේ. | සභාවට අයත් සියලු බැංකු ගිණුම් වල ශේෂ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | රු.30,000,000 ක දින 7 ඉල්ලුම් තැන්පතුවක් ආයෝජන ලෙස ගිණුම්ගත කර තිබුණු අතර මෙම තැන්පතුවට අදාළ සමාලෝචිත | තැන්පතුවට අදාල පොලී ආදායම විමසමින් ලංකා බැංකුව වෙත ලිපියක් යොමු කර ඇත. ඉදිරියේදී ඊට | පොලී ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. ඉල්ලුම් තැන්පතුව ප්‍රමිති |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ පොළිය රු.3,225,000 ක් ආදායම් ලෙස හඳුනාගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. 2023 ජුනි 16 දින ආරම්භ කර තිබූ මෙම ඉල්ලුම් තැන්පතුවේ සමාලෝචිත වර්ෂය අවසානයේ වටිනාකම රු.34,974,452 ක් වී තිබූ බැවින් ඒ අනුව එදිනට වත්කම් ශේෂය ද රු.4,974,452 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අදාලව කටයුතු කරනු ලැබේ. | ප්‍රකාරව ජංගම වත්කම් ශේෂයක් ලෙස නිවැරදි වටිනාකමට ගිණුම්ගත කල යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා සාර්ක් හස්ත කර්මාන්ත සංවර්ධන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට යෝජිත ඉඩම තක්සේරු කිරීම හා ඊට අදාළ ව්‍යාපෘති වාර්තාව සකස් කර ගැනීමට පුද්ගලික ආයතනයකට ගෙවන ලද රු.1,486,200 ක් ප්‍රාග්ධනිත කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකර එය වියදමක් ලෙස දක්වා තිබුණි. | එම වියදම ව්‍යාපෘතියේ මූලික වියදම ලෙස (Project Preparatory Work) දරන ලද වියදම බැවින් එය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොමැත. | ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද ආරම්භක වියදම් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර පසුව ප්‍රාග්ධනිත කල යුතුය. |
| (උ) | ඉදිකිරීම් සම්පූර්ණ නොවූ බුලත්සිංහල වේවැල් පුහුණු මධ්‍යස්ථානයේ අමුද්‍රව්‍ය බැංකුව ස්ථාපිත කිරීමට දරන ලද රු.මිලියන 3.45 ක වියදම කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කරනු වෙනුවට ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි. | දරන ලද වියදම් එම වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර ඇත. | කෙරීගෙන යන වැඩ හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවති 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත අලෙවි කරන ලද භාණ්ඩ වෙනුවෙන් සභාවට ලැබිය යුතු රු.2,432,122 ක ශේෂයක් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කරගෙන නොතිබුණි. | ලක්සල ආයතනය වෙත වරින් වර ලිපි යොමු කර ඇත. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | වරාගොඩ පිහිටි පළාත් කාර්යාලයේ ගබඩා කර තිබූ කිලෝග්‍රෑම් 2086.5 ක තඹ දුරකථන රැහැන් තොගය අස්ථානගත වීම සම්බන්ධයෙන් මූලික විමර්ශන කමිටුව විසින් 2023 අප්‍රේල් | පොලීසිය විසින් පරීක්ෂණයක් පැවැත්වෙන බැවින් ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා දිය නොහැකි බව දන්වා ඇත. | සිදු වූ අලාභය නොපමාව පෞද්ගලික ආරක්ෂක සේවා ආයතනයෙන් |

| | | | |
|---|---|---|---|
| | 20 දින නිකුත් කරන ලද මූලික විමර්ශන කමිටු වාර්තාවට අනුව ආයතනයට සිදු වූ රු.1,344,225 ක අලාභය පෞද්ගලික ආරක්ෂක සේවා සපයන ආයතනයෙන් නොපමාව අයකර ගත යුතු බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එකී අලාභය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2020 සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ කොන්ත්‍රාත්වලින් රඳවා ගන්නා ලද එකතු වටිනාකම රු.575,541 ක් වූ රඳවා ගැනීම් 05 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | රඳවාගත් මුදල් නිදහස් කරන ලෙස අදාළ ආයතන වලින් ඉල්ලීම් ඉදිරිපත් නොවීම නිසා රඳවා ගැනීම් ලෙස තබා ඇත. | වගකීම් කාලය අවසන්ව ඇති කොන්ත්‍රාත්කරුවන් ගේ රඳවාගත් මුදල් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

**1.7 නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීතිරීති /රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය | මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කරන ලදි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,962,487 ක ඌණතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.11,019,195 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,981,682 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට භාණ්ඩාගාර ප්‍රදාන රු.5,775,772 කින් වැඩිවීමට සාපේක්ෂව පෞද්ගලික පඩිනඩි වියදම් රු.23,434,486 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වේවැල්, පිත්තල, මැටි සහ අනෙකුත් ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන සැලසුම් ප්‍රකාරව විශේෂිත සම්ප්‍රදායික සහ ග්‍රාමීය රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අමුද්‍රව්‍ය බැංකු ආරම්භ | | |

| | | | |
|---|---|---|---|
| | කර්මාන්ත සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය ලබා ගැනීමට පහසුකම් පුළුල් කිරීම සඳහා අමුද්‍රව්‍ය බැංකු 9 ක් ආරම්භ කිරීම සඳහා 2021 දෙසැම්බර් 31 දින රු.10,555,480 ක් වටිනා වර්ග 21 ක වත්කම් උපකරණ අයිතම 248 ක් මිලදී ගෙන තිබුණ ද, 2024 නොවැම්බර් 25 දින තෙක් ම එම බැංකු ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම මිලදී ගැනීම් තුළ අමුද්‍රව්‍ය බැංකු 9 ක් සඳහා රු.1,033,600 ක් වැයකර මිලදී ගත් ආරක්ෂිත සේප්පු 9 ක් ද විය. තවද, අමුද්‍රව්‍ය බැංකු සඳහා 2021 වර්ෂයේ ලබා දී තිබූ මුදලින් රු.3,421,100 ක් සභාවේ වාහන තුනක් අලුත්වැඩියා කිරීමට භාවිතා කර තිබුණි. | අනුමැතිය හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සහිතව වාහන අලුත්වැඩියා කටයුතු සිදු කර ඇත. අමුද්‍රව්‍ය ගබඩා සඳහා මිලදී ගෙන ඇති ඌන උපයෝජිතව ඇති සියලු කාර්යාල උපකරණ ජාතික ශිල්ප සභා පළාත් කාර්යාල වල භාවිතය සඳහා යොදා ගන්නා ලෙස 2024.02.29 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. | කර මිලදී ගත් වත්කම් වලින් ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. ව්‍යාපෘති සඳහා වෙන්කල මුදල් ඒවා සඳහාම භාවිතා කළ යුතු අතර භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙනත් කාර්යයන් සඳහා යොදවා ගැනීමට භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | කර්මාන්ත අමාත්‍යාංශය විසින් බෙදාහරින ලද, වීරකැටිය හා තිස්සමහරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තිබූ පරිහරණය කරන ලද බතික් උපකරණ කුරුවිට උණබට පුහුණු මධ්‍යස්ථානයටත් හබරාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබූ උපකරණ හබරාදූව පුහුණු මධ්‍යස්ථානයටත් 2024 ඔක්තෝබර් 12 දින සිට පවරා දී තිබුණ ද එම උපකරණ විගණිත දින වූ 2025 අප්‍රේල් 30 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. මෙම වත්කම් ඉන්වෙන්ට්‍රිගත කිරීමක් හෝ ගිණුම්ගත කිරීමක් සිදුකර නොතිබීම හේතුවෙන් වත්කම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් ද ගැටළු පැවතුණි. 2023 වර්ෂයේ සිට හබරාදූව පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ පුහුණු කිරීම් නවතා දමා තිබුණි. | එවකට වේවැල්, පිත්තල, මැටි, ලීබඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා විවිධ ආයතනවල සම්පත් දායකත්වය යටතේ බතික් පුහුණු පාඨමාලා පවත්වා ඇති අතර එම අමාත්‍යාංශය අහෝසි වීමෙන් පසු එම වැඩසටහන් නතර වී ඇත. | අදාල වත්කම් භාවිතා කර ඵලදායි ලෙස පුහුණු කටයුතු සිදු කිරීමට හෝ වෙනත් සුදුසු රාජ්‍ය ආයතනයකට පවරා දීමට කටයුතු කළ යුතුය. වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. |
| (ඇ) | සභාව විසින් පුහුණු මධ්‍යස්ථාන 64 ක පවත්වාගෙන යන පුහුණු පාඨමාලා සඳහා විධිමත්ව විෂය නිර්දේශ සකස් කර නොතිබූ අතර, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයෙන් පුහුණුව ලද ශිල්ප උපදේශකයින් ඔවුන් පුහුණුව ලද විෂය නිර්දේශය මත පුහුණුවීම් කටයුතු සිදු කරන බව අනාවරණය විය. | ජාතික ශිල්ප සභාව මගින් සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත පාඨමාලා සඳහා ප්‍රමුඛතාව ලබා දී ඇති බැවින් එම වටිනාකම් පවත්වා ගනිමින් සාම්ප්‍රදාය ඉදිරියට ගෙනයාමේ අරමුණින් පවතින පැරණි විෂයය නිර්දේශ මත පුහුණු පාඨමාලා පවත්වනු ලබයි. කෙසේ නමුත් කාලීන | විධිමත් විෂය නිර්දේශ සහිතව සුදුසුකම් ලත් උපදේශකයින් යොදාගෙන පුහුණු පාඨමාලා පවත්වා ගත යුතුය. |

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | | අවශ්‍යතා සැලකිල්ලට ගෙන සුළු වශයෙන් වෙනසක් සිදු කර ඇත. | |
| (ඇ) | “ශිල්ප අභිමානි - 2024” ජාතික හස්ත කර්මාන්ත තරඟය සහ ප්‍රදර්ශනයට අදාල තරඟ කොන්දේසිවලට අනුව නිර්මාණ ඉදිරිපත් කිරිමට නම් ජාතික ශිල්ප සභාවේ ලියාපදිංචි වූවන්, විය යුතු විය. එසේ වුවද ජාතික හස්ත කර්මාන්ත තරඟයේ ඇතැම් සම්මානලාභීන් හා පළාත් තරඟයෙන් ජයග්‍රහණය ලැබූ ඇතැම් ශිල්පීන් එසේ ලියාපදිංචි වී නොතිබුණි. මෙසේ තරඟ කොන්දේසිවලට පටහැනිව ලියාපදිංචි නොවූ ශිල්පින් 17 දෙනෙකු සඳහා ජාතික තරඟයේ විනිශ්චය මත රු.285,000 ක ත්‍යාග මුදල් හා සහතික පත්‍ර ප්‍රදානය කර තිබුණි. | ලියාපදිංචි නොවූ ශිල්පීන්ගෙන් 07 දෙනෙකු දැනටමත් ලියාපදිංචි වී ඇති අතර, අනෙකුත් ශිල්පීන් ලියාපදිංචි කිරීමට කටයුතු කරමින් පවතී. එසේම ඉදිරි ශිල්ප අභිමානී තරඟ සඳහා ලියාපදිංචි නොවූ ශිල්පීන්ගේ නිර්මාණ තරඟ සඳහා ඉදිරිපත් නොකිරීමට කටයුතු කරනු ඇත. | හස්ත කර්මාන්ත තරඟ පැවැත්වීමේ දී විධිමත්ව හා වෘත්තීයභාවයෙන් යුතුව තරඟ කොන්දේසිවලට අනුකූලව කටයුතු කල යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 වර්ෂයේ දී දිස්ත්‍රික්ක 17 ක පුහුණු ක්ෂේත්‍ර 18 ක් ආවරණය වන පරිදි ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට අයත් ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන 94 ක් සභාවට පවරා දී තිබුණද සභාව මඟින් එම ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන බොහෝමයක් පවත්වා ගෙන නොයන අතර පිහන් භාණ්ඩ, අවාන්, මැහුම්, එම්බ්‍රොයිඩර් වැනි ක්ෂේත්‍රයන් සඳහා පුහුණු කිරීම සිදු නොකරයි. ඇතැම් සාම්ප්‍රදායික මෙන්ම දේශීය වශයෙන් වැදගත් කර්මාන්ත වන සාම්ප්‍රදායික චිත්‍ර, ලාක්ෂා, දැව කැටයම් හා උණබට කර්මාන්ත පුහුණු කිරීමේ මධ්‍යස්ථාන පැවතිය ද ඒවායේ පුහුණුලාභීන් පිරිස ද අඩු මට්ටමක පැවතුණි. | මධ්‍යස්ථාන ප්‍රමාණය අඩු කිරීමේ දී ස්ථිර රජයේ නොවන, පහසුකම් නොමැති, පන්සල් හා පොදු මධ්‍යස්ථාන වැනි ස්ථානවල පවත්වාගෙන යාම, ගුරුවරුන් විශ්‍රාම යාම, අදාළ ක්ෂේත්‍ර සඳහා සහ ප්‍රදේශයේ ආධුනික පැමිණීමේ දුර්වලතා ආදිය සැලකිල්ලට ගෙන ඇත. එවැනි තත්ත්වයක් තුළ ද දැනට ස්ථිර රජයේ නොවන ස්ථානවල පවත්වාගෙන යන මධ්‍යස්ථාන 14 ක් පමණ පවතී. එසේම මධ්‍යස්ථාන පැවරීමේ දී පැවති පුහුණු ක්ෂේත්‍ර 18 මේ වනවිට 27 ක් දක්වා පුළුල් කර ඇත. | පුහුණු මධ්‍යස්ථාන පිහිටි ප්‍රදේශ වලට ආවේනික හා ජනප්‍රිය හස්ත කර්මාන්ත එම ප්‍රදේශවල පුහුණු කල යුතුය. |
| (ආ) | වීරගුල මැටි කර්මාන්ත පුහුණු මධ්‍යස්ථානය තුළ නිෂ්පාදන මධ්‍යස්ථානය ද පවත්වා ගෙන යනු ලබන අතර 2019 වර්ෂයෙන් පසු එහි පුහුණු කිරීමේ කටයුතු සිදු නොවීම | මැටි කර්මාන්ත ගම්මානයක් මැද පවතින මෙම මධ්‍යස්ථානයට ආධුනිකයින් පැමිණීමේ අඩුවක් පවතින බැවින්, එය සේවා හා නිෂ්පාදන | මැටි කර්මාන්තය පවතින ප්‍රදේශයක් බැවින් ආකර්ශණීය ක්‍රමවේද තුලින් සිසුන් බඳවාගෙන විධිමත් |

| | | | |
|---|---|---|---|
| | නිසා එහි ස්ථානභාර නිලධාරි වශයෙන් කටයුතු කරන ශිල්ප සභාවේ නිලධාරිනිය සේවා වියුක්තව පැවතුණි. මෙම පුහුණු මධ්‍යස්ථානය තුළ සකපෝරු 2 ක් ද අක්‍රීය තත්වයේ පැවති අතර නිෂ්පාදන කටයුතුවල නිරත වන ශිල්පීන් දෙදෙනෙකු පමණක් මෙම මධ්‍යස්ථානයේ රාජකාරි කටයුතුවල නියැලෙමින් පැවතුණි. | මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. අක්‍රිය තත්ත්වයේ පවතින සකපෝරු අලුත්වැඩියාව පිළිබඳ සොයා බලා ඇති නමුත්, ඒ සඳහා විශාල මුදලක් වැය වන බවට ඇස්තමේන්තු වී ඇති බැවින්, එය සිදු කිරීම ඵලදායි ද යන්න ගැටළු සහගතය. එසේම මෙහි පූර්ණකාලීනව පැමිණ නිෂ්පාදන කටයුතු කරනුයේ දෙදෙනෙක් වුවද බාහිරව මැටි ඇඹරීම, පෝරණු කාර්යයන් වැනි කටයුතුවලට බාහිර ශිල්පීන් පැමිණෙන බව. | පුහුණුවක් හා ව්‍යවසායකත්ව පහසුකම් සැලසීම තුලින් මධ්‍යස්ථානයේ අරමුණු ලඟාකර ගත යුතුය. ස්ථානභාර නිලධාරිනිය මෙම ස්ථානයට අමතරව වෙනත් විකල්ප සේවා ස්ථානයකටද යොමු කිරීම තුලින් උපරිම සේවය ලබාග හැකිය. |
| (ඇ) | 2020 නොවැම්බර් 29 දින ජාතික තරුණ සේවා සභාවේ අබලි භාණ්ඩ වෙන්දේසියේ දී රු.1,586,723 ක් වටිනා භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ජාතික ශිල්ප සභාව මිලදී ගෙන තිබූ අතර නැවත ඒවා 2023 දෙසැම්බර් 12 දින රු.925,000 කට අලෙවි කිරීමෙන් සභාවට රු.661,723 ක පාඩුවක් සිදුවී තිබුණි. පාඩුවට වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීමට හා පාඩුව අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම අබලි භාණ්ඩ නිෂ්කාර්යව පැවති බැවින් අලෙවි කිරීමට කටයුතු කරන ලද බව. | රජයේ මුදල් උපරිම කාර්යක්ෂමතාවයකින්, අරපිරිමැස්මෙන් හා ඵලදායීව වැය කල යුතු අතර පාඩු සඳහා වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීම සඳහා කටයුතු කල යුතුය. |
| (ඈ) | 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනතේ 17 (ආ) වගන්තිය ප්‍රකාරව හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රයෝජනයට ගන්නා වූ අමුද්‍රව්‍ය හා නිමි භාණ්ඩවල තත්ත්වය වැඩිදියුණු කිරීම වෙනුවෙන් කටයුතු කිරීම ජාතික ශිල්ප සභාවේ අරමුණක් වන අතර, ඒ යටතේ වගා ව්‍යාපෘති සඳහා පැල 517,500 ක් මිලදී ගැනීමට 2023 හා 2024 වසරවලදී පිළිවෙලින් රු.1,456,726 ක් හා රු.2,246,400 ක් වූ අමාත්‍යාංශ අරමුදල් වැයකර තිබුණ ද වගා කිරීම සම්බන්ධ ප්‍රමාණවත් පසුවිපරමක් සිදුනොකිරීම හේතුවෙන් දරන ලද මුදලේ ඵලදායීතාවය පිළිබඳ ප්‍රමාණවත් තහවුරුවක් ලබා ගත නොහැකි විය. | ජාතික ශිල්ප සභාව ශිල්පීන්ගේ ඉල්ලීම් පදනම් කරගෙන අදාළ පැළ ලබා දී පැළ ලාභීන්ගේ අත්සන් සහිත ලේඛණයක් පළාත් නිලධාරීන් විසින් ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කර ඇති අතර අදාළ වගාවන් නිරීක්ෂණය කර ප්‍රගති වාර්තා ප්‍රධාන කාර්යාලයට ගෙන්වා ගෙන ඇත. | සභාවේ අරමුණු වලට අනුගතව කටයුතු කිරීම අවශ්‍ය වන අතර වැය කරන ලද මුදල් ඵලදායී ලෙස යොදාගෙන ඇති බවට තහවුරු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් යටතේ දක්වා තිබූ එකතු වටිනාකම රු.880,520 ක් වූ ශිල්ප අභිමානි 2023 පළාත් හා ජාතික හස්ත කර්මාන්ත තරඟය සහ ජනාධිපති සම්මාන උළෙල වැඩසටහන යටතේ දරන ලද එහෙත් අනුමත වියදම් ඇස්තමේන්තුවට ඇතුළත් නොවූ බැවින් අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය නොකරන ලද වියදමක් පාලක සභාවේ අනුමැතියකින් තොරව පෙර වර්ෂයේ අතිරික්තයෙන් ලියා හැර තිබුණි. | මෙම මුදල් අමාත්‍යාංශය මගින් ප්‍රතිපූරණය කිරීමට නොහැකි බව දන්වා ඇති බැවින් දිගින් දිගටම ලැබිය යුතු ශේෂයක් ලෙස පවත්වාගෙන යාමට නොහැකි බැවින් ලාභ අලාභ ගිණුමට ගැලපීමට කටයුතු කරන ලදි. | ඇස්තමේන්තු වලට අනුකූලව වියදම් දැරීමට කටයුතු කල යුතුය. අදාල වියදම තුල අමාත්‍යාංශය නොපිළිගන්නා වියදම් ඇතුලත් වන්නේ නම් එම වියදම් දැරීමට අනුමත කල හා සහතික කල නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හස්ත කර්මාන්ත ශිල්පීන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය සහන මිලට ලබාදීමේ අරමුණින් බුලත්සිංහල වේවැල් පුහුණු මධ්‍යස්ථානයේ අමුද්‍රව්‍ය බැංකුවක් ස්ථාපිත කිරීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම 2021 වර්ෂයේ ආරම්භ කර රු.මිලියන 3.45 ක් වැයකර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මූලික ඉදිකිරීම් තත්වයේ ඇති බැවින් මෙම ගොඩනැගිල්ල ඵලදායී කාර්යයකට භාවිතා කිරීමට නොහැකිව නිෂ්කාර්යව පැවතුණි. | 2022 වර්ෂයේ ජාතික අමුද්‍රව්‍ය බැංකු ස්ථාපිත කිරිම සඳහා ප්‍රතිපාදන වෙන් නොවීම හේතුවෙන් ඉදිකර ඇති ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට සුදුසු පරිදි වැඩ සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය. ඒ අනුව මෙම ගොඩනැගිල්ල භාවිතයට ගත හැකි පරිදි සංවර්ධනය කර හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල ව්‍යාපෘතියක් කිරීමට හෝ වෙනත් සුදුසු ව්‍යාපෘතියකට යොදා ගැනීමේ ඇති හැකියාව සම්බන්ධයෙන් බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් වෙතින් වාර්තාවක් කැඳවා ඒ අනුව සුදුසු පියවර ගැනිමට අපේක්ෂිතය. | නිම නොකළ ගොඩනැගිල්ල නිමකර ඵලදායි කාර්යයකට යොදා ගැනීමට හෝ වෙනත් පාර්ශවයක් වෙත විධිමත්ව පවරා දීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සභාව විසින් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් නිෂ්පාදන මාර්ගගත ක්‍රමයට අලෙවි කිරීම සඳහා Lakshilpa.com නමින් වෙබ් අඩවියක් ආරම්භ කිරීම වෙනුවෙන් 2021 හා 2022 වර්ෂවල දී රු.12,508,240 ක් වැයකර තිබුණි. 2022 සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ වෙබ් අඩවිය හරහා උපයා ඇති සමස්ත ආදායම රු.30,225 ක් වූ අතර, ඉන් රු.1,214 ක් සමාලෝචිත වර්ෂයේ | වෙබ් අඩවිය ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මගින් නොමිලේ සිදු කරන ලද එකක් බැවින් ඒ සඳහා රජයේ මුදල් වැය කිරීමක් සිදුකර නොමැත.<br><br>එසේම මෙම වෙබ් අඩවිය තුල ඇණවුම් කරන ලද භාණ්ඩ සභාව සතුව පවතීද යන්න හදුනාගැනීමේ පහසුකමක් නොමැත. එම පහසුකම ලබාදීමට ඇති හැකියාව | සුදුසු පරිදි සංවර්ධනය කර භාවිතයට යොමු කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | උපයා තිබුණි. ගණුදෙනුකරුවන් විසින් වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගත ක්‍රමයට ඇණවුම් කරන ලද භාණ්ඩවල තොග සභාව සතුව නොතිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ රු.34,973 ක මුදලක් ගණුදෙනුකරුවන් වෙත ආපසු ගෙවා තිබුණි. මේ හේතුවෙන් වෙබ් අඩවිය ස්ථාපිත කිරීම වෙනුවෙන් දරන ලද වියදම ද නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | සොයා බලා ඒ අනුව අදාල වෙනස්කම් සිදු කිරිමට කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) | 2013 වර්ෂයේ සිට දීර්ඝ කාලීන බදු පදනම මත කාවන්තිස්සපුර ගම්මානය ඉදිකිරීම සඳහා හෙක්ටයාර් 1.6187 ක භූමියක් තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගෙන ඉන්දිය රජයේ මූල්‍ය ආධාර රු.18,432,042 ක් හා සභාව විසින් රු.8,744,211 ක් වැය කර ඉදිකිරීම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී ද භූමිය හා ගොඩනැගිලි ඵලදායී ලෙස උපයෝජනය කර නොතිබුණි. තවද ඒ සඳහා බදු කුලී වශයෙන් රු.36,768,000 ක් හා සමාලෝචිත වර්ෂය සඳහා ආරක්ෂක ඇතුළු වෙනත් වියදම් වශයෙන් රු.1,403,402 ක් සභාව විසින් දරා තිබුණි. | කාවන්තිස්සපුර හස්ත කර්මාන්ත ගම්මානය ස්ථාපිත කරන විට එම ප්‍රදේශය තුල සංචාරක විභවතාවයක් පැවතියද වර්තමානය වනවිට සංචාරක විභවතාවය ඉතා අඩු තත්වයක පවති. ඒ අනුව හස්ත කර්මාන්ත ගම්මානයක් ලෙස පවත්වාගෙන යාම සාර්ථක නොවේ. මෙනිසා ඉඩම හා දේපල පිළිබදව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් හා කාර්මික සංවර්ධන මණ්ඩලය සමඟ සාකච්ඡා කර ඵලදායී කාර්යයකට යොදා ගැනීමට කටයුතු කරනු ලැබේ. | කාවන්තිස්ස පුර ගම්මානය ඵලදායීමව ආයෝජනය කිරීමට හෝ සුදුසු කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | වේවැල් යන්ත්‍ර 03 ක් නිෂ්පාදනය කර ගැනීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට 2022 මැයි 24 දින රු.3,850,740 ක් ගෙවා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම යන්ත්‍ර හෝ ගෙවූ මුදල් සභාව වෙත ලැබී නොතිබුණි. | මෙම මුදල ජාතික ශිල්ප සභාවට ආපසු ගෙවනු ලබන බවට කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දී ඇති බැවින් එම මුදල ඉල්ලා ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. | රජයේ මුදල් උපරිම කාර්යක්ෂමතාවකින් යුතුව ප්‍රයෝජනයට ගත යුතු අතර යන්ත්‍ර සූත්‍ර හෝ මුදල් නොපමාව ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

**3.4 ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම් ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වලව්වත්ත පුහුණු මධ්‍යස්ථානය සඳහා බතික් අපජලය පිරිපහදු කිරීමේ පද්ධතියක් 2023 වර්ෂයේ ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ | මෙම කාලය තුල පුහුණු පාඨමාලාව අවසන් කල සිසුන් සඳහා නිෂ්පාදන කටයුතු සිදු කරගෙන යාමට අවස්ථාව ලබා | අදාළ පද්ධතිය ක්‍රියාත්මකව පවත්වා ගැනීමට,හැකිවන පරිදි සුදුසු වැඩපිළිවෙලක් |

| | | | |
|---|---|---|---|
| | මූලිකත්වයෙන් ඉදිකර තිබුණ ද 2024 වර්ෂය තුල මධ්‍යස්ථානයේ එක් පාඨමාලාවක් පමණක් පවත්වා තිබීම හේතුවෙන් එහි ක්‍රියාකාරීත්වය නිසි පරිදි පවතින්නේ ද යන්න පරීක්ෂා කිරීමට නොහැකි වී තිබුණි. | දෙන ලද අතර 2025 වර්ෂයේ කෙටිකාලීන පාඨමාලාවක් ආරම්භ කර මේ වනවිට අවසන් කර ඇත. 2025 ජූලි මස වනවිට NVQ 03/04 බතික් පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. පළාත් නිලධාරීන් හරහා හඳුනා ගන්නා ලද පුහුණු මධ්‍යස්ථාන අනුව කෙටිකාලීන පුහුණු පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. | සකසා අප ජලය පිරිපහදු කිරීමේ පද්ධතියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | වලච්චත්ත පුහුණු මධ්‍යස්ථානය බතික් පුහුණු මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කර ගාස්තු අය කරන NVQ බතික් පාඨමාලා ආරම්භ කිරීමට 2024 වර්ෂයේ සැලසුම් කර තිබුණ ද 2025 ජනවාරි වන විටත් සභාව එය ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | 2025 වසරේ දී නැවතත් බතික් පාඨමාලා ආරම්භ කිරීමට අවශ්‍ය පියවර මේ වන විටත් ගෙන ඇත. දැනට පවතින පාඨමාලාවෙන් පසුව 2025 අප්‍රේල් මාසයේ දී NVQ පාඨමාලාව ඇරඹීමට සැලසුම් කර ඇත. | පුහුණු මධ්‍යස්ථාන වලින් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි වන පරිදි කාර්යභාරයන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |